**ජාතික ශිල්ප සභාව - 2015**

**---------------------------------**

ජාතික ශිල්ප සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනතේ 84(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ශිල්ප සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජංගම නොවන වත්කම් වශයෙන් දක්වා තිබූ රු.772,735 ක් වටිනා පුස්තකාල පොත් සඳහා වූ ක්ෂය ප්‍රතිපත්තිය නිශ්චය කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රදානයන්ගෙන් මිලදීගෙන තිබුණු රු.99,460,609 ක් වූ ජංගම නොවන වත්කම් වාර්ෂිකව ක්ෂය කර ඇතත්, එයට අදාළ ක්ෂය ක්‍රමක්ෂය ලෙස ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට අදාළ හඳුනාගත් හර හා බැර පිළිවෙලින් රු.590,754 ක් සහ රු.57,267 ක් සමාලෝචිත වර්ෂයේ විවිධ ආදායම් සහ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විගණන ගාස්තු රු.97,385 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන් කිරීම් රු.255,007 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් දෙදෙනෙකුට ගෙවිය යුතු පාරිතෝෂික මුදල් ගණනය කිරීමේදී, එකතුව රු.662,564 ක් අඩුවෙන් ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

(ඉ) මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී, උපචිත වියදම් වල සිදු වූ රු.1,294,550 ක වෙනස සහ පොදු තැන්පත්වල සිදු වූ රු.55,000 ක වෙනස ගැලපීම් කර

නොතිබූ අතර, අනෙකුත් ජංගම වත්කම්වලින් සිදු වූ වෙනස රු.1,172,638 ක් සහ ලැබිය යුතු ගිණුම්වල සිදු වූ වෙනස රු.634,789 ක් වැඩියෙන් ගැලපීම් කර තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් 2010 සහ 2011 වර්ෂ වලදී නීත්‍යානුකූලව ශිල්ප සභාව වෙත පවරා දී තිබූ වාහන 03 ක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.2,800,000 කට තක්සේරු කර තිබුණද ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට භෞතික තොග සත්‍යාපනය පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව ආයතනයේ අංශ 13 කට අදාළව සමීක්ෂණය සිදුකර තිබූ අතර, විවිධ භාණ්ඩ වර්ග විශාල ප්‍රමාණයක වටිනාකම සටහන් කර නොතිබූ නිසා මුළු තොග වටිනාකමට එම භාණ්ඩවල පිරිවැය ඇතුළත් වී නොතිබුණි.

(ii) ප්‍රධාන කාර්යාලය, කොටුව ශිල්ප අත්කම් අලෙවිහල හා මොලගොඩ ශිල්ප අත්කම් අලෙවිසැලේ 2015 දෙසැම්බර් 31 දිනට අයිතම 106 ක තොග ඌනතාවයන් සමීක්ෂණ මණ්ඩලය විසින් හඳුනාගෙන තිබුණද එම තොග ඌනතාවයන්ගේ වටිනාකම හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(iii) භාවිතයට ගත නොහැකි ප්‍රධාන කාර්යාලයේ රු.136,487 ක් වූ ලිපි ද්‍රව්‍ය තොග ගිණුම්වල ගැලපුම් කර නොතිබුණි.

(iv) සමීක්ෂණ මණ්ඩලය විසින් අංශ 03ක ද්‍රව්‍ය වර්ග 15 කට අදාළව අතිරික්ත තොග හඳුනාගෙන තිබුණද, මෙම අතිරික්ත තොග ගිණුම්වලට ගැලපුම් කර නොතිබුණි.

(ඌ) 2015 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුම් 04 කට අදාළව එකතුව රු.855,036 ක හඳුනා නොගත් බැර හා බැංකු ජංගම ගිණුම් 02 කට අදාළව එකතුව රු.166,924 ක හඳුනා නොගත් හර, හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) ශිල්ප සංවර්ධන අරමුදල් බැංකු ජංගම ගිණුමට 2012,2013 හා 2015 වර්ෂවලදී තැන්පත් කරන ලද එකතුව රු.159,895 ක තැන්පතු මුදල් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලෙජර් ගිණුම් අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.927,647 ක් වුවද, අත්තිකාරම් උපලේඛන අනුව එම ශේෂය රු.1,286,785 ක් වූයෙන් රු.359,138 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ස්ථාවර වත්කම් ගිණුම් 07 කට අදාළ ශේෂයන් ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සැසඳීමේදී රු.27,071,449 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**---------------------------------**

පහත සඳහන් ගිණුම්වලට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
| --- | --- | --- |
| | රු. | |
| මෝටර් රථ | 10,562,498 | වාහන 14 සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ණයගිමියෝ | 273,975 | ශේෂ සනාථ ලිපි |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.2,660,038 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 1 ට අඩු වූ ණය ශේෂවල එකතුව රු.180,500 ක් ද, වසර 1 සිට 2 දක්වා වූ ණය ශේෂවල එකතුව රු.2,432,122 ක් ද, වසර 3 හා ඊට වැඩි පැරණි ණය ශේෂවල එකතුව රු.47,416 ක් ද වූ අතර මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.3,405,298 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයෙන් වසර 1 ට අඩු වූ ණය ශේෂවල එකතුව රු.932,790 ක් ද, වසර 1 සිට 2 දක්වා වූ ණය ශේෂවල එකතුව රු.200,000 ක් ද, වසර 3 හා ඊට වැඩි පැරණි ණය ශේෂවල එකතුව රු.2,272,508 ක් ද වූ අතර මෙම හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට පියවරගෙන නොතිබුණි.

(ඇ) අත්තිකාරම් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට පැවති රු.359,137 ක් වූ අවිනිශ්චිත ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශිල්ප සභාව විසින් ජනාධිපති කාර්යාලය වෙත බුදු පිළිම 10 ක් 2014 වර්ෂයේදී ලබාදී තිබූ අතර, ඒ වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු.345,750 ක් ජනාධිපති කාර්යාලයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

## 2.4 නීති රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

විගණනයේදී පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1983 අංක 13 දරන පාරිතෝෂික ගෙවීම් පනත | සේවකයෙකු විශ්‍රාම ගිය දින සිට දින 30 ක කාලයක් තුළ පාරිතෝෂික මුදල් ගෙවීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ විශ්‍රාම ගිය සේවකයින් 06 දෙනෙකුට ගෙවීම් කිරීමේදී එම කාල සීමාව ඉක්මවා ගෙවීම් ප්‍රමාද කර ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.2.6 වගන්තිය | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, නිලධාරීන් දෙදෙනෙකුට වැඩ බැලීමේ වැටුප් ලෙස රු.97,575 ක් වර්ෂය තුළ ගෙවීම් කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්ය අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවත්, 1993 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලය තුළ ලබාදී තිබූ එකතුව රු.1,286,785 ක අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 (ඇ) | මාස 06 ඉක්මවූ එකතුව රු.69,683 ක් වටිනා චෙක්පත් 27 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 756(1) | 2015 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩලය පත්කිරීම 2016 මාර්තු 14 දින දක්වා ප්‍රමාද කර තිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 වගන්තිය | කාර්ය සාධන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර කාර්තුව අවසන් වී දින 30ක් ඉකුත් වීමට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත නොකරන ලද ජර්නල් සටහනක් මගින් රු.5,227,905 ක උපචිත වියදම් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සේවක ණය උපලේඛනයේ 2015 ජනවාරි 01 දිනට පැවති රු.104,050 ක අවිනිශ්චිත ශේෂයෙන් රු.88,300 ක් විධිමත් අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදල් ගිණුමෙන් කපා හැර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.12,226,762 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,035,819 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,190,943 ක පිරිහීමක් දක්නට ලැබුණි. ශිල්ප සභාවේ මුළු ආදායම 2014 වසරට සාපේක්ෂව රු.3,517,643 කින් පහල යාම සහ සභාවේ මුළු වියදම රු.4,673,300 කින් ඉහල යාම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී ජාතික ශිල්ප සභාවේ දායකත්වය 2011 වර්ෂයේදී රු.67,404,637 ක් වූ අතර එය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.133,765,748 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේදී ශිල්ප සංවර්ධන හා සුභසාධන කටයුතු සඳහා සියයට 25.55 ක් වැයකර තිබූ අතර, අනුග්‍රාහක මුදල් ලැබීම් අඩු වීම මත දේශීය හා විදේශීය ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ සඳහා දරන ලද වියදම සමාලෝචිත වර්ෂයේදී සියයට 88.07 කින් අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

හස්ත කර්මාන්ත භාණ්ඩ ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ අලෙවි කිරීම සම්බන්ධයෙන් උපදෙස් දීම සහ සහාය වීම, හස්ත කර්මාන්ත නිෂ්පාදන පුළුල් කිරීම සහ නිමි භාණ්ඩවල තත්ත්වය සහ ප්‍රමිති වැඩිදියුණු කිරීම, ශිල්පීන් පුහුණු කිරීමේ කාර්යය සඳහා මධ්‍යස්ථාන වැඩපොලවල් සහ වෙනත් ආයතන පිහිටුවීම, නඩත්තු කිරීම සහ මෙහෙයවීම, ශ්‍රී ලංකාවේ හා විදේශවල ප්‍රදර්ශන පැවැත්වීම, කර්මාන්තය සඳහා අවශ්‍යවන දේශීය අමුද්‍රව්‍ය සුලභ කිරීම මගින් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදනයන් ඉහල නැංවීම මෙම සභාවේ ප්‍රධාන අරමුණු විය.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ ආයතනය විසින් පවත්වන ලද විවිධ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව හා පුහුණුව ලැබූ සංඛ්‍යාව සැසඳීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ පුහුණුව ලැබූ සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහල ගොස් තිබුණද, 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ දී පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සියයට 27.31 කින් සහ පුහුණුලාභීන් සංඛ්‍යාව සියයට 29.85 කින් පහල ගොස් තිබුණි.

(ආ) පුහුණු මධ්‍යස්ථාන මගින් පූර්ණකාලීනව පුහුණුව ලැබූ ආධුනිකයින් සංඛ්‍යාව 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 13.79 කින් ඉහල ගොස් තිබූ අතර, ඒ අනුව පුහුණු මධ්‍යස්ථාන මගින් පූර්ණකාලීනව ආධුනිකයින් පුහුණු කිරීමේ වර්ධනයක් සිදු වී තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ වර්ෂ 04 ක කාලය තුළ වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන්, තරඟ හා ප්‍රදර්ශන පැවැත්වීමේ ප්‍රගතිය ක්‍රමයෙන් වර්ධනය වී තිබූ අතර, 2014

වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම වැඩසටහන්වල වර්ධනයක් සිදු වී නොතිබුණි.

(ඇ) හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය සඳහා 2014 වර්ෂයේදී රු.33,203,728 ක් ලබාදී තිබූ අතර, 2015 වර්ෂයේදී එම කාර්යය සඳහා ප්‍රතිපාදන ලබාදී නොතිබුණි.

(ඉ) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී වෙනත් ආදායම් සියයට 69.23 කින් අඩුවී තිබුණි. ගාල්ල අලෙවිසැල වසා දැමීම මත, 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී ශිල්ප අරමුදල සඳහා ලැබීම් සියයට 78.7 කින් අඩුවී තිබූ අතර, 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී අනුග්‍රාහක මුදල් ලැබීම් අඩුවීම මත, විදේශීය ප්‍රදර්ශන හා දායකත්ව වැඩසටහන්වලින් ලද ආදායමද සියයට 79.58 කින් අඩුවී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රධාන කාර්යයන් 07 ක ප්‍රගතිය සියයට 50 ට අඩු මට්ටමක පැවති අතර, අමුද්‍රව්‍ය වගා කිරීම හා බෙදාහැරීම සඳහා පහසුකම් සැපයීම, හස්ත කර්මාන්ත නිෂ්පාදන හා අලෙවි ගම්මාන පිහිටුවීම, ශිල්පීන් සඳහා විදේශ පුහුණුව ලබාදීම සහ කාවන්තිස්සපුර නිෂ්පාදන හා අලෙවි ගම්මානයේ විශේෂ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම යන ප්‍රධාන කාර්යයන් 04 ක් 2015 වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 මැයි මාසයේ ඉතාලියේ එක්ස්පෝ මිලානෝ 2015 වැඩසටහනට සහභාගී වීම සඳහා අයදුම් කරන ලද හස්ත කර්මාන්ත ශිල්පියෙකු විසින් රු.56,000 ක් වැය කර තම ගුවන් ටිකට් පත්‍ර මිලදීගෙන තිබුණද අදාළ කාලසීමාව තුළ වීසා ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශ කඩිනමින් ලබා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන්, ශිල්පියාට එම වැඩසටහනට සහභාගී වීමට නොහැකි වී තිබුණි. ඒ අනුව ශිල්පියා විසින් ගෙවා තිබූ ගුවන් ටිකට් පත්‍ර ගාස්තුව ශිල්ප සභාව විසින් ශිල්පියා වෙත ගෙවීම් කිරීමට සිදුවී තිබුණි.

(ආ) ශිල්ප සභාව මගින් ශිල්පීන් දිරිමත් කිරීම සඳහා ඉටු කරනු ලබන ජාතික හස්ත කර්මාන්ත තරඟය හා ප්‍රදර්ශනය සඳහා ශිල්පීන් ඉදිරිපත් කරනු ලබන විවිධ නිර්මාණ අස්ථානගත වීම හා කැඩී විනාශවීම් සිදු වූ අවස්ථා නිරීක්ෂණය වූ අතර, ඒවා ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් හා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) යාපනයේ ඉදිකිරීමට යෝජිත හස්ත කර්මාන්ත නිෂ්පාදන හා අලෙවි ගම්මානයේ ඉදිකිරීම් කටයුතු සඳහා වසර 30 ක බදු කාලයකට රජයේ ඉඩමක් බදු පදනම මත ලබාගෙන තිබුණද එම දීර්ඝකාලීන බදුකරය සඳහා බදු ගිවිසුමකට එළඹ නොතිබුණි. මෙම බදුකරය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු.96,000 ක් වූ බදු මුදල 2016 නොවැම්බර් දක්වා ගෙවා නොතිබුණි.

(ඈ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් 99 අවුරුදු බදු පදනම මත සභාවට පවරා තිබුණු බත්තරමුල්ල තලංගම පිහිටි ඉඩමේ පැවති ගොඩනැගිලි කඩා ඉවත් කර නව ගොඩනැගිලි ඉදි කර තිබූ අතර, මෙම ඉඩමේ මායිම් නිශ්චිතව හඳුනාගෙන නිරවුල් කිරීමට කළමනාකරණය විසින් 2016 අගෝස්තු දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඉ) සීගිරිය හස්ත කර්මාන්ත ගම්මානය පිහිටි හෙක්ටයාර් 1.1165 ක් වූ ඉඩම ශිල්ප සභාව වෙත පැවරීම සඳහා අදාළ සහතික අත්සන් කර 2013 අප්‍රේල් 18 දින දඹුල්ල ප්‍රාදේශීය ලේකම්

වෙත යොමුකර තිබුණද මෙම ඉඩම පවරා ගැනීමේ කටයුතු 2016 වර්ෂය වන විටත් අවසන් කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඊ) ඉන්දියානු රජයේ මූල්‍ය අනුග්‍රහය යටතේ හම්බන්තොට කාවන්තිස්සපුර ඉදිකිරීමට යෝජිත හස්ත කර්මාන්ත නිෂ්පාදන හා අලෙවි ගම්මානය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නිෂ්පාදන හා අලෙවි ගම්මානය ඉදිකිරීම සඳහා 2013 ඔක්තෝබර් 29 දින සිට වසර 30 ක් සඳහා හෙක්ටයාර් 1.6187 ක ඉඩමක් බදු පදනම මත ලබාදී තිබුණද 2016 ජූලි 31 දිනය වන විටත්, නියමිත බදු හා වාර මුදල් ගෙවා ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉඩමේ භුක්තිය විධිමත් පරිදි භාරගෙන නොතිබුණි.

(ii) යෝජිත ගම්මාන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා අදාළ කොන්ත්‍රාත්තුව ඉන්දියානු රජය විසින් 2013 ජූලි 17 දින දේශීය කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිරිනමා තිබූ අතර එම ඉදිකිරීම් 2014 ජූනි 30 දින වන විට නිමකල යුතු වුවත්, කොන්ත්‍රාත්කරු නිසි පරිදි ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් අදාළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2016 ජූලි 31 දිනය වන විටත්, අවසන් කර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සීගිරිය ශිල්ප ගම්මානයේ ගොඩනැගිල්ලක් සහ අලෙවි කුටි 12 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

ඉන්දියාවේ බැංගලෝර්හි ප්‍රථමවරට පැවැත්වූ ශිල්ප ප්‍රදර්ශනයක් සඳහා එම ප්‍රදර්ශනයේ ප්‍රතිලාභ පිළිබඳ පූර්ව විශ්ලේෂණයකින් තොරව ශිල්පීන් 13 දෙනෙකු ශිල්ප සභාව මගින් සහභාගී කරවා තිබුණි. ප්‍රදර්ශනය අසාර්ථක වීම හේතුවෙන් සහභාගී වූ ශිල්පීන්ගේ ගුවන් ටිකට් පත්‍ර සඳහා වැය වූ මුදලින් අඩක් වූ රු.211,250 ක් ශිල්ප සභාව විසින් ශිල්පීන්ට ගෙවීම්කර තිබූ අතර, මෙම ප්‍රදර්ශනය සඳහා ශිල්ප සභාව දරන ලද එකතුව රු.347,862 ක වැය ආර්ථික නොවන වියදමක් විය.

## 4.5 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිල්ප සභාවේ අලෙවිසැලක සහ ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන තුනක විදුලි බිල්පත් හා ජල බිල්පත් නිසි පරිදි නොගෙවීම නිසා විදුලිය හා ජලය විසන්ධි කර තිබූ අතර, එම සේවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා 2015 වර්ෂය තුළ එකතුව රු.33,872 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) ශිල්ප 2014 ජාතික හස්ත කර්මාන්ත තරඟය හා ප්‍රදර්ශනය 2015 වර්ෂයේදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වා තිබුණි. එම ප්‍රදර්ශනය හා තරඟය සඳහා ශිල්පීන් 04 දෙනෙක් ඉදිරිපත් කල නිර්මාණ අස්ථානගත වීම නිසා, එම නිර්මාණකරුවන්ට එකතුව රු.31,600 ක් සභාව මගින් ගෙවා තිබුණි.

## 4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපළ වල ව්‍යාපෘති ආරම්භ කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දීර්ඝ කාලයක් තිස්සේ පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන ගිය ශිල්ප සභාව වෙත හස්ත කර්මාන්ත මණ්ඩලයෙන් නීත්‍යානුකූලව පවරාගෙන නොමැති ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 07 ක ගොඩනැගිලි නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සඳහා 2015 වර්ෂය තුලදී රු.1,414,227 ක් සභාව මගින් ගෙවා තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් පොල්ගොල්ල පේෂකර්ම ව්‍යාපෘති පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති සහ ශිල්ප සභාවට නීත්‍යානුකූල හිමිකාරත්වයක් නොමැති මධ්‍යම පළාත් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සඳහා 2015 වර්ෂය තුළදී රු.1,529,385 ක් ගෙවා තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිල්ප සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 262 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 239 ක් වූයෙන් ද්විතීය මට්ටමේ කාර්ය මණ්ඩලයේ 06 ක්, තෘතීය මට්ටමේ කාර්ය මණ්ඩලයේ 22 ක් ඇතුළුව කාර්ය මණ්ඩලයේ 28 ක පුරප්පාඩුවක් පැවති අතර, ප්‍රාථමික මට්මමේ කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 21 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 26 ක් වූයෙන්, සේවකයින් 05 ක අතිරික්තයක් පැවතුණි.

(ආ) ද්විතීයික හා තෘතීක මට්ටමේ කාර්ය මණ්ඩල ඌනතාවය හේතුවෙන් 2014 වර්ෂයේදී 120 ක් පැවති ශිල්ප පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව 2015 අවසානයට 112 දක්වා අඩුවී තිබූ අතර, ආයතනය තුළ අභ්‍යන්තර පාලනය, වැඩ බෙදීම අභ්‍යන්තර පරීක්ෂාව සහ අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් යෙදවීමට නොහැකි වී තිබුණි.

(ඇ) ගිණුම් හා ප්‍රසම්පාදන නිලධාරී තනතුරෙහි සේවය කළ නිලධාරියා 2014 පෙබරවාරි මාසයේදී සේවයෙන් ඉල්ලා අස්වී තිබුණද, එම තනතුර සඳහා ස්ථිර සේවකයෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පසුගිය වර්ෂ 5 තුළ මුළු සේවක සංඛ්‍යාව වැඩි වී තිබූ අතර, මුළු සේවක පිරිවැය 2011 වර්ෂයේදී රු.62,027,154 ක සිට 2015 වර්ෂය වනවිට රු.127,993,035 ක් දක්වා රු.65,965,881 කින් ඉහල ගොස් තිබුණි. ඒ අනුව එක් සේවක සාමාන්‍ය පිරිවැය 2011 වර්ෂයේදී රු.273,247 සිට 2015 වර්ෂය වන විට රු.518,190 දක්වා සියයට 89.64 කින් වර්ධනය වී තිබුණි

## 4.8 වාහන උපයෝජනය

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් ශිල්ප සභාව වෙත 2015 ජූනි 03 දින සිට තාවකාලිකව අනුයුක්ත කර තිබූ වාහන 05 ක් අතුරින් වාහන 03 ක් රු.240,500 ක් ගෙවා අළුත්වැඩියා කර තිබුණු අතර ඉතිරි වාහන 02 තාවකාලිකව අනුයුක්ත කළ දින සිට ධාවනයට නුසුදුසු තත්ත්වයේ පැවතීම හේතුවෙන් ශිල්ප සභා ප්‍රධාන කාර්යාල භූමියේ ගාල් කර තිබුණි.

(ආ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 වගන්තිය අනුව, ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අධීක්ෂණය යටතේ වාහන අපහරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතු වුවත්, 2014 අප්‍රේල් මාසයේ සිට ධාවනයෙන් ඉවත් කළ සභාව සතු වෑන්

රථයක් අපහරණය කිරීමට කටයුතු නොකර නිෂ්ක්‍රීය වත්කමක් ලෙස වර්ෂ දෙකකට අධික කාලයක් අනාරක්ෂිතව කාර්යාල භූමිය තුළ ගාල් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ගිණුම් ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2016 ජුනි 06 දින එනම් මාස 03 ක ප්‍රමාදයකින් පසුවය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

පහතින් සඳහන් නිරීක්ෂණ හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(අ) අයවැයගත පුනරාවර්තන වියදම, තත්‍ය පුනරාවර්තන වියදම් සමඟ සැසඳීමේදී වියදම් ශීර්ෂ 18 ක සියයට 14 සිට සියයට 514 අතර විචලනයන් පැවතීම.

(ආ) අයවැයගත සංවර්ධන වියදම, තත්‍ය සංවර්ධන වියදම සමඟ සැසඳීමේදී වැඩසටහන් 04 ක සියයට 17 සිට සියයට 180 අතර විචලනයන් පැවතීම.

(ඇ) සංවර්ධන වැඩසටහන යටතේ උප වැඩසටහන් 04 ක් සඳහා ලැබී තිබුණු එකතුව රු.4,475,000 ක සංවර්ධන ප්‍රතිපාදන මඟින් වියදම් දැරීමට කටයුතු නොකිරීම නිසා එම අයවැයගත ප්‍රතිපාදනය සියයට 100 ක් ඉතිරි වීම.

### 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අවසාන විගණිත ගිණුම් සමඟ විගණන වාර්තා භාෂාත්‍රයෙන්ම පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2013 වාර්ෂික වාර්තාව සභාගත කිරීමට 2016 මාර්තු 10 දක්වා ප්‍රමාද කර තිබූ අතර, 2014 වාර්ෂික වාර්තාව 2016 අගෝස්තු 31 දින දක්වා සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 පෙබරවාරි 08 දිනැති අංක අමප/08/2322/349/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය යටතේ දිවයින පුරා පිහිටි ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන සහ එහි දේපළ ජාතික ශිල්ප සභාව වෙත පවරා තිබුණි. නමුත්, හස්ත කර්මාන්ත මණ්ඩලයේ ගිණුම් අනුව මධ්‍යස්ථානවලට අයත් රු.46,000,000 ක් වූ වත්කම් ගිණුම්ගත කර

නොතිබුණි. මෙම වත්කම් අතර තිබුණු වාහන 03 ක සහ ස්ථිර ගොඩනැගිලි 69 ක නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව වෙත පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී ශිල්ප සභා භූමියේ ශිල්ප ගම්මානයට පිවිසීම සඳහා රු.1,152,902 ක් වැය කර ඉදිකරන ලද දැව පාලම විවෘත කිරීමටත් පෙර වෙනත් සංවර්ධන කටයුත්තක් සඳහා කඩා ඉවත් කර තිබුණි. මුදල් රෙගුලාසි 504 ප්‍රකාරව මෙම වත්කම් පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතු වේ.

| පද්ධති හා පාලන කේෂ්ත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | ලැබිය යුතු ශේෂ අයකර නොගැනීම, බැංකු ගිණුම් පවත්වාගෙන යාම සහ බැංකු සැසඳුම් සකස් කිරීමේදී නිරවුල් නොකල ශේෂ පැවතීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම සහ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම සහ සමීක්ෂණය කිරීම ප්‍රමාද කර සිදු කිරීම. |
| (ඇ) ගබඩා පාලනය | ගබඩා ද්‍රව්‍ය සහ ප්‍රදර්ශන භාණ්ඩ තොග පරිපාලනය යාවත්කාලීනව නොකිරීම. |
| (ඈ) අභ්‍යන්තර පාලනය | අභ්‍යන්තර චක්‍රලේඛ හා උපදෙස් ලබා දී ඒ අනුව කටයුතු නොකිරීම. |